# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 67 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ සංස්ථා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 3 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1081 නොවැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිල : ශත : 20 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

**1981 අංක 67 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ සංස්ථා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 3 වන දින]

එල්. ඩී.—ඕ. 36/80.

**1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1981 අංක 67 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1970 අංක 33 දරන පනතෙහි 2අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ සංස්ථා පනතේ 2 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"අමාත්‍ය මණ්ඩලය විසින් භාර කරනු ලබන යම් කටයුත්තක් සංස්ථාව විසින් කර ගෙන යා යුතු බව.

2අ. මේ පනතේ 2 වන වගන්තියේ කුමක් සඳහන් ව ඇත ද, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන යම් ව්‍යාපාරයක හෝ කර්මාන්තයක හෝ යම් වාණිජ කටයුත්තක නිරතවීම හෝ එවැනි යම් ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් හෝ යම් වාණිජ කටයුත්තක් පවත්වා ගෙන යාම හෝ මේ පනත යටතේ පිහිටුවන ලද යම් සංස්ථාවක් විසින් කරනු ලැබිය හැකි ය.".

සංශෝධනය අතීතයට බලපෑම.

3. මේ පනතේ 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරන ලද සංශෝධනය, ඒ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයෙහි ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, මේ පනත ක්‍රියාත්මක වූ දිනයට පෙර, ඒ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සංස්ථාවක් විසින් නිරත වී සිටි හෝ පවත්වා ගෙන යනු ලැබූ යම් ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් හෝ යම් වාණිජ කටයුත්තක් වලංගු ලෙස නිරත වී සිටි ව්‍යාපාරයක්, කර්මාන්තයක් හෝ වාණිජ කටයුත්තක් බවට හෝ වලංගු ලෙස පවත්වා ගෙන ගිය බවට හෝ සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.